# **RUAF-FStT-** ව්‍යාපෘතිය

## මග පෙන්වීමේ පියවර 2.1
## දේශීය තත්ත්ව විශ්ලේෂණය

**කාල සීමාව** - සති 7 - 10

**සහභාගිත්වය** - දේශීය කණ්ඩායම
3-4 මූලික දැනුම් දෙන්නන් / තොරතුරු සපයන්නන්
පිරිමි 10 හා ගැහැණු 10 වන නිෂ්පාදකයන්

**අරමුණු**

- නාගරික ක්‍රියාවලිය නිසා ප්‍රදේශයේ සිදු වන වෙනස් වීම් පිළිබඳව තොරතුරු එකතු කිරීම (නාගරික පරිපාලන පද්ධතියේ නීති හා රෙගුලාසි, සමාජ - දේශපාලනික සම්බන්ධතා වෙනස් වීම) අනෙකුත් ගැටලු (නව ගොඩනැගීම්, ඉඩම් මිල ඉහල යාම, කම්කරු හිගය, පාරිසරික ගැටලු) නව අවස්ථා (වඩා යහපත් ප්‍රවාහන පහසුකම්, වෙළඳපොල තොරතුරු)

- ආයතන, රාජ්‍ය නොවන සංවිධාන හා ගොවීන්ට සේවා සපයන පෞද්ගලික සංවිධාන ලැයිස්තු ගත කිරීම (පර්යේෂණ, ව්‍යාපෘති, පුහුණු, ණය පහසුකම්, සෞඛ්‍ය සේවා) සපයන සේවාවන් සහ ඊට අදාල ගැටලු හා අවස්ථා.

**01 තොරතුරු නැවත විශ්ලේෂණය.**
**සූදානම් වීම**

මූලික තොරතුරු සපයන්නන් සමග සම්මුඛ පරීක්ෂණවලින් පසුව මෙය ක්‍රියාත්මක කරනු ලැබේ. ඊට හේතුව අවශ්‍ය තොරතුරු ලබා ගත හැකි ලියකියවිලි, ඒවා ලබා ගත හැකි ස්ථාන පිළිබඳව ඔවුන්ගෙන් සහයෝගය ලබා ගත හැකි වීමයි. එබැවින් එම ලියකියවිලි සම්බන්ධයෙන් ගැටලු කිහිපයක් සම්මුඛ පරීක්ෂණය අවසානයේදී යොමු කල හැකිය.

පසුගිය වසර කිහිපයක පර්යේෂණ වාර්තා, සංඛ්‍යා ලේඛණ, නාගරික සංවර්ධන හා ඉඩම් පරිහරණය පිළිබඳව වන සැලසුම් අදාල සිතියම් ආදිය සඳහන් වේ.

**01 ක්‍රියාත්මක කිරීම.**

- එක් රැස් කර ගත් තොරතුරු වගුගත කිරීම. ලියකියවිලි වලින් ලබා ගන්නා ලද තොරතුරු හා තොරතුරු සපයන්නන්ගෙන් ලබා ගත් දත්ත අවසන් තත්ත්ව විශ්ලේෂණ වාර්තාවලට ඇතුලත් විය යුතුය.

- වාර්තා කියවීම හා දත්ත රැස් කිරීම සඳහා කෙටි කාල සීමාවක් ප්‍රමාණවත් වේ. වඩාත්ම වැදගත් තොරතුරු හඳුනා ගැනීම වැදගත් වේ.

**02 මූලික තොරතුරු සපයන්නන් සමග සම්මුඛ සාකච්ඡාව - සූදානම් වීම.**

- සාකච්ඡා කිරීමට නියමිත ප්‍රධාන මාතෘකා සහ ප්‍රශ්න ලැයිස්තුවක් සකස් කිරීම.
- සම්මුඛ පරීක්ෂණ සඳහා සුදුසු පුද්ගලයන් හඳුනා ගැනීම.
    - o මහජන නියෝජිතයින් / ප්‍රජා නායකයන්
    - o කෘෂි ව්‍යාප්ති සේවාවන්
    - o කෘෂිකර්ම දෙපාර්තමේනතුව
    - o නගර සැලසුම්කරණ දෙපාර්තමේන්තුව
    - o විශ්ව විද්‍යාල හා පර්යේෂණ ආයතන
    - o රාජ්‍ය නොවන සංවිධාන වලට අයත් පුද්ගලයන් මේ සඳහා උචිත වේ.

එවන් පුද්ගලයන් හදුනා ගැනීම සඳහා පහත ක්‍රම භාවිතා කළ හැක.

a) නගර හා කෘෂිකර්ම සංවර්ධනයට අදාල තොරතුරු හා ලේඛණ නැවත විශ්ලේෂණය.
b) ව්‍යාපෘති බල ප්‍රදේශය හා අවට ප්‍රදේශවල සිදුවන වෙනස්කම් පිළිබඳව තොරතුරු ලබා ගත හැකි ආයතන හා පුද්ගලයන් ලැයිස්තු ගත කිරීම.
c) අන්තර්ජාලය භාවිතා කිරීම.

- හඳුනාගත් පුද්ගලයන් හා ආයතන ලැයිස්තු ගත කිරීම හා වඩාත් සුදුසු කිහිප දෙනෙකු තෝරා ගෙන ඔවුන් මුණ ගැසිය හැකි වේලාව සහ දිනය වෙන් කරවා ගැනීම.
- එම පිරිසට මෙම කාර්යයේ අරමුණ හා සාකච්ඡාවට නියමිත මූලික ගැටළු පිළිබඳව සඳහන් / ඇතුලත් වන දිනය සහ වේලාව සනාථ කිරීමේ ලිපියක් යැවීම.

**ක්‍රියාත්මක කිරීම**.

- අඩු තරමින් පුද්ගලයින් දෙදෙනෙක් වත් සම්මුඛ පරීක්ෂණයන්ට ලක් කිරීම සුදුසු වේ. එක නිලධාරියෙකු සමඟ නිෂ්පාදකයන් එක් අයෙකු හෝ දෙදෙනෙකු සහභාගී වීම මැනවි. නිලධාරී මහතා සටහන් තබා ගන්නා අතර අනෙක් දෙදෙනාට සම්මුඛ පරීක්ෂණය කරගෙන යා හැකිය. පෙර සූදානම වැදගත් වන අතර පරීක්ෂණය අතරතුර බාධා කිරීම් නොකළ යුතුය.

- ඔබ ගැන හා ව්‍යාපෘතිය පිළිබඳව කෙටි හැඳින්වීමකින් සම්මුඛ පරීක්ෂණය ආරම්භ කළ හැකිය. සිතියමක ආධාරයෙන් ඔබේ අවධානය යොමු වන ප්‍රදේශය ඉදිරිපත් කළ හැකි නම් වඩාත් සුදුසුය.

- මාතෘකා එකිනෙක පිළිබඳව පියවරෙන් පියවර විමසිය යුතුය. නොපැහැදිලි පිළිතුරු නැවත විස්තර කර දෙන මෙන් හෝ උදාහරණ සමඟ ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිය හැක. උපරිම කාලය ලෙස පැය 1 1/2 ක් ප්‍රමාණවත් වේ.

- සියළුම මාතෘකා ආවරණය වූ පසු ලබා දුන් සහයෝගය වෙනුවෙන් අදාල තොරතුරු සපයන අයට ස්තුති කරමින් සම්මුඛ පරීක්ෂණය නිමා කළ හැකිය. එසේම වැඩි විස්තර අවශ්‍ය වූ විටෙක ඔහු / ඇය නැවත සම්බන්ධ කර ගන්නා ආකාරය පිළිබඳව විමසීම සුදුසු වේ. අනෙක් පුද්ගලයන් වෙත ඇති යෝජනා පිළිබඳව ද විමසිය හැකිය.

- එදිනම හෝ පසු දින සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල වාර්තාකරණය කළ හැකිය.

**නිමැවුම් / ප්‍රතිඵල**

- සියළුම සම්මුඛ පරීක්ෂණ නිම වූ පසු ප්‍රතිඵල විශ්ලේෂණය කර මූලික තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ පරීක්ෂණ පිළිබඳ ව කෙටි වාර්තාවක් පිළියෙළ කළ හැකිය. පහත ආදර්ශනය ඒ සඳහා භාවිතා කළ හැක.

**තෝරා ගත් නාගරික නිෂ්පාදකයින්ගේ රැස්වීම**.

**සූදානම් වීම**.

- තම පරිසරයේ හා නිෂ්පාදන ක්‍රමවල මෑත වකවානුවේ දැකිය හැකි වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කිරීමට 20 දෙනෙකුගෙන් යුත් (10 පිරිමි හා 10 ගැහැණු) ගොවි කණ්ඩායමක් තෝරා ගෙන රැස්වීමකට ආරාධනා කරන්න. ගොවි කණ්ඩායම් කිහිපයක් ඇත්නම් සියළුම කණ්ඩායම් නියෝජනය වන පරිදි ගොවීන් තෝරා ගත යුතුය. දේශිය කණ්ඩායම් සිටින නියෝජිතයන් සමඟ අදාල තෝරා

ගැනීමේ සාදක තීරණය කිරීම උචිත වේ. නැතහොත් නිෂ්පාදකයන්ගේ ලැයිස්තුවෙන් අහඹු ලෙස තෝරා ගත හැකිය.

- තෝරා ගත් නිවාසවලින් අඩක් සඳහා පිරිමි නියෝජිතයන් ද අනෙක් අඩ සඳහා කාන්තා / ගැහැණු නියෝජිතයන්ට ද ආරාධනා කිරීම සුදුසු ය.

- කණ්ඩායම් සාකච්ජා සඳහා උපාංග සූදානම් කර ගැනීම හා තමන් ද සූදානම් වීම.

**ක්‍රියාත්මක කිරීම**

- ගොවි නියෝජිත මහතෙක් විසින් පැමිණ සිටින පිරිස පිළිගන්නා අතර දේශීය කණ්ඩායම හා පැමිණ සිටින පිරිස තම තමන් හඳුන්වා දීම.

- රැස්වීමේ අරමුණ හා වෙනස්කම් / තත්ත්වය පැහැදිලි කිරීම.

- කාන්තා / පිරිමි මිශ්‍ර වන ලෙස කණ්ඩායම උප කණ්ඩායම් 2 / 4 කට බෙදීම.

- ඔවුනගේ ප්‍රදේශයේ ආදායම් මාර්ග වගා ක්‍රම ආදියෙහි පසු ගිය කාලියේ ඇති වූ වැදගත් වෙනස්කම් පිළිබඳව කණ්ඩායමේ සාමාජිකයන්ගෙන් විමසීම. අපැහැදිලි ගැටළු සරලව පැහැදිලි කර දිය හැකිය. සෑම සාමාජිකයෙකුටම අවස්ථාව දීම සුදුසු වේ. මේ සඳහා 2.1.2. නිෂ්පාදකයන් සමඟ වෙනස්කම් විශ්ලේෂණය සඳහා වන වගුව ප්‍රයෝජනවත් වේ.

- අභ්‍යාසය අවසන් වූ පසු සහභාගි වූවන් ට ස්තුති කිරීම සහ ක්‍රියාවලියේ ඊලඟ පියවරයන්හිදී මෙම තොරතුරු වැදගත් වන ආකාරය පැහැදිලි කිරීම.

- මූලික තොරතුරු සපයන්නන්ගේ සම්මුඛ පරීක්ෂණ වාර්තාව හා ගොවීන් සමඟ පැවැති වෙනස්කම් අධ්‍යනයේ ප්‍රතිඵල එකතු කරමින් වාර්තාවක් සකස් කිරීම.

- සම්මුඛ පරීක්ෂණයට සම්බන්ධ වූ මූලික තොරතුරු සපයන්නන්ට අදාල මූලික වාර්තාව සහ ඔවුන්ගේ විවේචන ලබා ගැනීම. අනෙකුත් තොරතුරු හොඳින් අධ්‍යනය කර එම විවේචන ද එක් කර ගනිමින් / ලැබුණු පසු අවසන් වාර්තාව සකස් කිරීම.

**නිමැවුම් / වාර්තාකරණය**

- වෙනස්කම් අධ්‍යනය වාර්තා කිරීම - පහත ව්‍යුහය සුදුසු ය.

1 **හැඳින්වීම**

1.1 මූලික තොරතුරු සපයන්නන් සමඟ සම්මුඛ පරීක්ෂණය

- සම්මුඛ පරීක්ෂණයට ලක් කල පුද්ගලයන් ඔවුන්ගේ කාර්යභාරය හා සංවිධානය - ඔවුන් සම්බන්ධ කර ගත හැකි ආකාරය (දුරකතන අංකය සහ ලිපිනය) .

- සම්මුඛ පරීක්ෂණය අවබෝධ කර ගත පුද්ගලයන් ඔවුන්ගේ කාර්යභාරය හා සංවිධානය.

- ප්‍රතිඵලවලට බලපෑ හැකි සාදක හා වාර්තාව කියවීමේදී සැළකිය යුතු කරුණු (උදා: කලින් සැලසුම් කළ ද සහභාගී වීමට නොහැකි වූ අය සමහර නිෂ්පාදන කෙරෙහි දක්වන ලද කැමැත්ත ආදිය)

1.2 නිෂ්පාදක කණ්ඩායම් සමඟ සම්මුඛ පරීක්ෂණය

- කවර දිනකදී කුමන ස්ථානයක කුමන කණ්ඩායම් සහභාගී වුණා ද යන්න සහ එක් එක් කණ්ඩායමේ සාමාජිකයින් ගණන (ගැහැණු පිරිමි ලෙස)

- ප්‍රතිඵලවලට බලපෑ හැකි සාදක හා වාර්තාව කියවීමේදී සැළකිය යුතු කරුණු (උදා: කලින් සැලසුම් කළ ද සහභාගී වීමට නොහැකි වූ අය සමහර නිෂ්පාදන කෙරෙහි දක්වන ලද කැමැත්ත ආදිය)

## 2 සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල

2.1 උප නගර කලාපවල ඇති / පවතින / දැකිය හැකි වෙනස්කම් හා තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය කෙරෙහි වන බලපෑම පහත දැක්වෙන වගු ඒ සඳහා ප්‍රයෝජනවත් වේ.